www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# තමිල්නාඩුවේ දොට්ට දැමීම් ඉන්දියානු කම්කරුවන්ට එරෙහි නව ප්‍රහාරයක් සංඥා කරයි

**Tamil Nadu sackings signal new offensive against Indian workers**

**ගනේෂ් දේව් සහ කේ. රත්නායක විසිනි**
**2003 සැප්තැම්බර් 3**

ජුලි මාසය මුල දී ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ වර්ජනයේ යෙදී සිටි රාජ්‍ය අංශයේ කම්කරුවන් 200,000ක් සේවයෙන් පහ කිරීම, රට පුරා කම්කරු පන්තියේ සමාජ තත්වයන් හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එරෙහි ප්‍රහාරයක පදනම බවට වේගයෙන් පත් වෙමින් තිබේ. තමිල්නාඩු මහාධිකරනය හා ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරනය විසින් අනුමත කෙරුනු, මහා ව්‍යාපාරිකයන් හා ජනමාධ්‍ය විසින් ආදර්ශයක් ලෙස හුවා දක්වනු ලැබුනු පෙර නොවූ විරූ මෙම ප්‍රහාරයට නවදිල්ලියේ භාරතීය ජනතා පක්ෂ ආන්ඩුවේ පිටුබලය ද ලැබී තිබේ.

වර්ජනය පැන නැගුනේ සමස්ත ඉන්දීය අන්නා ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම (ඒඅයිඒඩීඑම්කේ) ප්‍රාන්ත ආන්ඩුව විසින් විශ්‍රාමික හා අනෙකුත් අයිතීන් බාදනය කර දැමීමට එරෙහිව රාජ්‍ය අංශයේ කම්කරුවන්ගේ ප්‍රතිරෝධය දැක්වීමේ ප්‍රතිඵලයක් ලෙස ය. ඉන්දීය රුපියල් 90,000 සිට 125,000 දක්වා වටිනා ප්‍රතිලාභ පසුගිය වසර දෙක පුරා සිදුකෙරුනු කපා හැරීම්වලින් කම්කරුවන්ට අහිමිවූ අතර එය විරෝධතා හා වර්ජන මාලාවක් අවුලුවා ලීය.

රාජ්‍ය අංශයේ කම්කරුවන්ගේ වර්ධනය වන්නා වූ සටන්කාමීත්වයට ප්‍රතිචාර ලෙස තමිල්නාඩු ආන්ඩුව විසින් රුදුරු අත්‍යවශ්‍ය සේවා පවත්වා ගැනීමේ පනත (ඊඑස්එම්ඒ) මැයි මාසයේ දී සම්මත කර ගත්තේ ය. එමගින් රාජ්‍ය අංශයේ සෑම කොටසක්ම පාහේ "අත්‍යවශ්‍ය" හා වර්ජනය කිරීම් තහනම් වන බවට පත්වේ. නව නීති රීති "විනය ක්‍රියාත්මක කිරීම" හා "ප්‍රාන්තයේ ආර්ථික තත්වය වැඩිදියුනු කිරීමට" අවශ්‍ය බව මුදල් ඇමති සී. පොන්නයියන් එම අවස්ථාවේ දී ප්‍රකාශ කලේ ය.

වාර්ෂික ප්‍රතිලාභ දීමනා කපා හැරීමේ ප්‍රාන්ත ආන්ඩුවේ පිලිවෙතට එරෙහි 2003 මාර්තුවේ දී සංකේත වර්ජනයක් කැඳවීමට රජයේ සේවකයන්ගේ සංගම්වල හා ගුරු සංගම්වල ඒකාබද්ධ ක්‍රියාකාරී කමිටුවට (ජේඒසීටීඕ-ජීඊඕ) බල කෙරුනි. එම දිනයේ දී ම ගුරු සංවිධානවල හා සේවක සංවිධානවල ඒකාබද්ධ සම්මේලනය (සීඕටීඊ-ජීඊඕ) මහා උපවාසයක් කැඳවීය.

තම සාමාජිකයන් අතර පැතිරී පවතින කෝපය අබිමුව, වෘත්තීය සමිති, ඉල්ලීම් 15ක් සඳහා - විශ්‍රාම හා අනෙකුත් ප්‍රතිලාභ නැවත පිහිටුවාලීම සඳහා වූ ඉල්ලීම් ප්‍රධාන කොටගත් - සටන් වැදීමට, ජුලි 2 සිට අඛන්ඩ වැඩ වර්ජනයක් කැඳවීය. වර්ජනයට දින දෙකකට පෙර දී වෘත්තීය සමිති නිලධාරීන් හා ක්‍රියාකාරීන් සිය ගනනක් අත් අඩංගුවට ගනිමින් වර්ජනය අඩපන කිරීමට ප්‍රාන්ත ආන්ඩුව උත්සාහ ගත්තේ ය. අත්අඩංගුවට ගැනීම් හා පොලිස් හිරිහැර කිරීම් ඊලඟ දින දෙක තුල දී ද ක්‍රියාත්මක වූ අතර, ඊට එරෙහි විරෝධතා වර්ජන හා සේවයෙන් බැහැර යාමේ රැල්ලක් ප්‍රාන්තයේ අගනුවර මදුරාසියේ ඇවිල ගියේ ය.

ආන්ඩුවේ මෙම ක්‍රියාකාරකම්, කම්කරුවන් බියට පත් කිරීම වෙනුවට සිදු වූයේ වර්ජන කැඳවීමට ඉමහත් ප්‍රතිචාරයක් ලැබීම යි. රාජ්‍ය අංශයේ කම්කරු බලකායෙන් සියයට 90ක්, එනම් මිලියනයකටත් වඩා කම්කරුවෝ, ජුලි 2 දා වැඩ නැවැත්වූහ. වර්ජනයට එක් වූ සංඛ්‍යාවෙන් පැහැදිලිව ම භීතියට පත් වූ ප්‍රාන්ත ප්‍රධාන ඇමති ජයරාම් ජයලලිතා, ජුලි 4 දා, ඊඑස්එම්ඒ පනතට හදිසි සංශෝධනයක් ගෙන ආවා ය. එමගින් අතීතයට බලපාන පරිදි වර්ජනය කරන හෝ ඊට පොලඹවන ඕනෑම අයෙකු සේවයෙන් නෙරපා හැරීමටත් දැවැන්ත දඩ සහ සිර දඬුවම් නියම කිරීමටත් හැකිවන පරිදි ඇය බලය පවරා ගත්තා ය.

ඊලඟ දින කීපය තුල දී, ඉන්දියානු ඉතිහාසයේ දැවැන්ත ම දොට්ට දැමීම සිදු කරමින් 200,000 ආසන්න කම්කරුවන් ක්ෂනිකව ඉවත් කරනු ලැබිනි. කම්කරුවන්ට රැකියා පමනක් නො ව බොහෝ අවස්ථාවල දී තම නිවාස ද අහිමි විය. පුරප්පාඩු පිරවීම සඳහා කෙටිකාලීන කොන්ත්‍රාත් පදනම මත හොරිකඩයන් දහස් ගනනක් දෙනා - ඉන් බොහෝ දෙනා පාලක ඒඅයිඒඩීඑම්කේ පක්ෂය සමග සමීප සබඳතා පැවැත්වූවන් වෙති - සේවයට බඳවා ගැනීමට ජයලලිතා ක්‍රියා කලාය. ඒ අතරතුර දී පොලිසිය අත්අඩංගුවට ගැනීම් දිගට ම ක්‍රියාත්මක කලා ය.

මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එරෙහි ප්‍රහාරයේ දැවැන්තභාවය තිබියදී ම වෘත්තීය සමිති හා ඉන්දීය මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂය (සීපීඅයිඑම්) ඇතුලු විරුද්ධ පක්ෂ කම්කරු පන්තියේ පලල් සහයෝගයක් ලබා ගැනීම සඳහා කටයුතු නො කල අතර දොට්ට දැමූ සේවකයන් අසාර්ථක නීති ව්‍යායාමයන් කරා මෙහෙයවූහ. දැනට මත් නඩු පිරිඉතිරී ගොස් ඇති,

එක් විනිශ්චයකරුවෙකුගෙන් පමනක් සමන්විත රාජ්‍ය පරිපාලන විනිශ්චය සභාව හරහා නැවත සේවයට කැඳවීම ඉල්ලුම් නො කිරීමේ හේතුව මත, දොට්ට දැමීම් නැවැත්වීම සඳහා ඉල්ලා සිටි පෙත්සම, තමිල්නාඩු මහාධිකරනය, ජූලි 11 දා, ඉවත දැමී ය.

මහාධිකරනය එකඟ වූයේ පෙත්සම්වල එක් කරුනකට පමනකි: අත් අඩංගුවට ගැනුනවුන් නිදහස් කිරීම. සිරභාරයෙන් නිදහස් වූ වෘත්තීය සමිති නායකයෝ වහාම වර්ජන කමිටුව කැඳවා ජූලි 12 දා කොන්දේසි විරහිතව තවදුර කාර්මික අරගල නවතා දැමීය. වෘත්තීය සමිති නායක ජී. සූර්යමූර්ති ප්‍රකාශ කලේ මහාධිකරන තීන්දුවලට එරෙහි අභියාචනය කිරීමේ අදහසක් ජේඒසීටීඕ-ජීඊඕ හා ජේඒසීටීඕ-ජීඊඕ වෙත නොමැති බවත් එසේ කරනු ලබන ඕනෑම කම්කරුවෙකුට සදාචාරාත්මක සහයෝගය ලබා දෙන බවත් ය.

වර්ජනය අවසාන වීම හා දොට්ට දැමීම්වලට එරෙහිව පලල් උද්ඝෝෂනයක් නොමැති වීමේ තත්වය වහා අල්ලා ගත් ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරනය පෙර නොවූ විරූ දුරදිග යන පූර්වාදර්ශයක් පිහිටුවීමට අවස්ථාව පාදා ගත්තේ ය. විනිශ්යකාරයන් දෙදෙනෙකුගේ මන්ඩලයක් මගින්, ජූලි 24 දා, සේවකයන්ට වර්ජනය කිරීම සඳහා කිසිදු මූලික අයිතිවාසිකමක් නොමැති බවත් එවැනි නීතිවිරෝධී වර්ජන පාලනාධිකාරිය විසින් ශක්තිමත්ව මැඩලිය යුතු බවටත් තීන්දුවක් ප්‍රකාශයට පත් කලේ ය. එය, දොට්ට දැමූ කම්කරුවන් ඔවුන් විසින් කොන්දේසි විරහිත සමාව අයැදුම් කිරීමකින් පසු පමනක් නැවත සේවයේ පිහිටුවීම සඳහා ප්‍රාන්ත ආන්ඩුවට යෝජනා කල අතර එසේ කල යුතු යයි නියෝග නො කලේ ය.

165,000ක් පමන කම්කරුවන් නැවත සේවයේ පිහිටුවීමෙන් පසු, ඊඑස්එම්ඒ නීතියට එරෙහි විරෝධතාව ඉවතලමින් අගෝස්තු 6 දා සිය අවසාන තීන්දුව ප්‍රකාශයට පත් කරමින් ශ්‍රේෂ්ඨාධිකරනය සඳහන් කලේ සේවකයන්ට වර්ජනය කිරීම සඳහා "මූලික, නීතිමය, සදාචාරමය අයිතියක් නැති බව" ය. කම්කරු පන්තියට කෙරෙහි සතුරු භාවයෙහි කිඳී ගිය පිටු 25ක තීන්දුවකින් විනිශ්චයකාරයෝ මෙසේ කියා සිටියහ: කිසිඳු දේශපාලන පක්ෂයකට හෝ සංවිධානයකට ප්‍රාන්තයක හෝ රාජ්‍යයක ආර්ථික හා කාර්මික ක්‍රියාකාරකම් අඩපන කිරීමට මහජනයා අසීරුවට පත් කිරීමට අයිතියක් ඇතැයි ඉල්ලා සිටිය නො හැකි ය." වර්ජන ක්‍රියාව "බොහෝ දුරට වැරදි ආකාරයට යොදා ගත් බව" සඳහන් කිරීමෙන් අනතුරුව, දුක්ගැනවිලි සමනය කර ගැනීම සඳහා සේවකයන් "අවංකව, කාර්යක්ෂමව හා උද්‍යෝගිමත්ව වැඩි වැඩ කොටසක්" ඉටුකර ස්වාමියාගේ හොඳ දිනා ගත යුතු යයි ඔවුහු සඳහන් කලහ.

## ආර්ථික ප්‍රතිසංස්කරනයේ නව වටයක්

ශ්‍රේෂ්ඨාධිකරන තීන්දුව තමන්ගේ ප්‍රහාරය උත්සන්න කිරීම සඳහා වූ කොල එලිය දැල්වීමක් ලෙස තමිල්නාඩු ආන්ඩුව වහාම සලකා ගත්තේ ය. අගෝස්තු 12 දා, මහඇමති ජයලලිතා, ප්‍රධාන වෘත්තීය සමිති 26ක් හා අනෙකුත් සම්බන්ධිත සමිති 20ක ලියාපදිංචිය අහෝසි කිරීමට පියවර ගත්තා ය. ජේඒසීටීඕ හා සීඕටීඒ සම්මේලනවල පිලිගැනීම ඉවත් කර ගැනුනි. "ප්‍රචන්ඩත්වයේ" හා අන් අය වර්ජනයට "උසි ගැන්වීමේ" චෝදනා ලැබූ කම්කරුවන් 6,000කට වැඩි දෙනෙකු නැවත සේවයේ පිහිටවනු නො ලැබුනු අතර ඔවුන් මදුරාසි මහාධිකරනයේ විනිශ්චයකාරවරුන් තුන් කට්ටුවක් ඉදිරියට ඇද ගෙන යාමට නියමිත ය.

ප්‍රාන්ත ආන්ඩුවේ පිලිවෙතට මහා ව්‍යාපාර ඉතසිතින් සහාය දුන්නේ ය. ෆෝඩ් ඉන්ඩියා, ටාටා, සහ හින්දුස්ථාන් මෝටර්ස් ඇතුලු ඉන්දියාවේ ප්‍රධාන සමාගම 70ක විධායකයින් සහභාගි වූ, මදුරාසියේ දී ජූලි 25 දා පැවැත්වුනු, ඉන්දියානු කර්මාන්ත ඒකාබද්ධ සම්මේලනයේ (සීඅයිඅයි) ජාතික සභාවේ රැස්වීමට ගරු ආරාධිතයා ලෙස සහභාගි වූ ජයලලිතාට ඔවුහු ප්‍රශංසා වැසි වැස්සවූහ.

රැස්වීම අමතා සීඅයිඅයි සභාපති ආනන්ද් මහින්ද්‍රා මෙසේ කීවේ ය: "රාජ්‍ය අංශයේ සේවක වර්ජනය ගැන කටයුතු කිරීමේ දී මහ ඇමති දැක්වූ අසාමාන්‍ය දෘඪභාවය කර්මාන්ත අංශයට වෛෂයික පාඩමකි." මීට ප්‍රතිචාර වශයෙන්, සමාගම් ප්‍රධානීන් තමන්ගේ ම උද්ඝෝෂනයක් ඇරඹිය යුතු යයි ජයලලිතා ඔවුන්ගෙන් ඉල්ලා සිටියා ය. "මෙය තරගකාරී ලෝකයකි. අලසයන් තමන්ගේ තෘප්තිමත් භාවය ගැන පසුතැවුනාවේ. ඔබගේ මූලෝපායන් නැවත තක්සේරු කර, අවස්ථාවන් ගැන සොයා තදින් ක්‍රියාත්මක වන ලෙස උනන්දු කරවීමට මම කැමැත්තෙමි" යි ඇය කියා සිටියා ය.

සංගතවලින් ජයලලිතාට ලැබුනු සහාය ඉන්දියානු ආර්ථික ප්‍රතිසංස්කරන ඉතා අවම වේගයකින් සිදුවන බවට පාලක කවයන්හි පවතින උත්සුකයේ පිලිබිඹුවකි. ඉන්දියානු ආර්ථිකය විදේශ ආයෝජන සඳහා විවෘත කිරීම, රජයේ වියදම් කපා හැරීම හා රාජ්‍ය සතු ව්‍යාපාර පුද්ගලීකරනය කිරීමේ දුරදිග යන ආර්ථික ප්‍රතිසංස්කරන පිලිවෙතක්, 1990 ගනන්වල දී, කොන්ග්‍රස් හා බීජේපී ආන්ඩු විසින් ආරම්භ කරන ලදි.

කෙසේ වුවත්, පමා කෙරී ඇති "දෙවන පරම්පරාවේ ප්‍රතිසංස්කරන" ක්‍රියාවට දැමීම සඳහා, කාලයක් තිස්සේ, මහා ව්‍යාපාර බල කරමින් සිටී. මෙම ක්‍රියාවලියේ ප්‍රධාන එල්ලය වන්නේ රාජ්‍ය අංශයේ ඉතිරිව ඇති කොටස්, රාජ්‍ය සුභසාධන හා කම්කරු පන්තිය සූරාකෑමේ දී පවතින සීමාසහිත නීතිමය බාධකයන් ය. විශේෂයෙන්ම, සේව්‍යයන්ට සිය අවශ්‍යතාව පරිදි කම්කරුවන් සේවයට බඳවා ගැනීම හා දොට්ට දැමීමට - මෙය කම්කරුවන් අතර පැතිර ගිය විරෝධතාවක් අවුලුවා ඇත - හැකිවන පරිදි රටේ කම්කරු නීති විශාල වශයෙන් සංශෝධනය කිරීමකි.

රාජ්‍ය අංශයේ කම්කරුවන් භුක්ති විඳින අයිතීන්, විශේෂයෙන් ම පුහුනු හා උගත් සේවකයන්ගේ, වැටුප් හා සේවා කොන්දේසි කපා දැමීමට බාධකයක්ව පවතින බව සංගත ප්‍රධානීහු සලකති. සාපේක්ෂව ආරක්ෂිත යැයි සැලකෙන "වැටුප් සහිත" රැකියාවල නියැලෙන්නේ ඉන්දීය කම්කරු බලකායෙන් හීන වී ගෙන යන සුලු කොටසකි. පසුගිය වසරේ ප්‍රකාශයට

පත් කෙරුනු සැලසුම් කොමිසමේ වාර්තාවට අනුව 1999-2000 වර්ෂවල දී "වැටුප් සහිත" වූවන් 6.7%ක් වන විට 37.3% දෙනා "තාවකාලික" හා ඉතිරි 56% දෙනා "ස්වයං-රැකියා" වල යෙදී සිටියහ.

ඉහත 6.7% මගින් නියෝජනය වන මිලියන 28ක සේවක පිරිස "සංවිධිත ක්ෂේත්‍රය" නමින් හැඳින්වෙන අංශවල සේවය කරති. මේ අතරින් අතිවිශාල බහුතරයක් - යන්තම් සියයට 69 කට අඩු - රාජ්‍ය අංශයේ සේවකයන් වන අතර, ඔවුන් බොහෝ දෙනෙකු වෘත්තීය සමිතිගතව සිටිති. පසුගිය දශකයේ ප්‍රහාරයන් තිබිය දී වුව ඔවුන්ගේ වැටුප් හා වෙනත් දීමනා බොහෝ දුරට සුරැකී පවතී. මේ තත්වය රාජ්‍ය වියදම් කප්පාදුවට සහ සමස්තයක් ලෙස කම්කරු පන්තියේ සේවා තත්වයන්ගේ හා වැටුප්වල කප්පාදුවට එරෙහිව පවතින ඉවසිය නො හැකි බාධකයක් ලෙස මහා සංගත සලකති.

තමිල්නාඩු ආන්ඩුව වෙනුවෙන් මහා සංගත හා ජනමාධ්‍යයන්ගෙන් නැගෙන හැඟීම්බර ප්‍රශංසාව එබැවිනි. ඉන්දියන් එක්ස්ප්‍රස් පුවත්පතේ තීරු ලිපිකරුවෙකු "ජයලලිතාගේ විශිෂ්ට යෝග්‍ය ක්‍රියාව" පැසසුමට ලක් කරමින් "වර්ජනවලට එලඹෙන්නට නියමිත අයට එරෙහිව තීරනාත්මකව හා අප්‍රමාදව ක්‍රියාකිරීමට අනෙකුත් ප්‍රාන්ත ආන්ඩුවලට වේදිකාව සකසා ඇතැ" යි ප්‍රකාශ කර සිටියේ ය. අසල්වාසී ශ්‍රී ලංකාවේ ද මේ තත්වය පිලිරුව් දුන් අතර ඩේලි මිරර් පුවත්පත "වර්ජන පිලිකාවට හදිසි ශල්‍යකර්මයක්" යන හිසින් කතුවැකියක් පල කොට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වර්ජනය නීතිවිරෝධී කරන ලෙස ආන්ඩුවට බල කොට සිටියේ ය.

නවදිල්ලියේ බීජේපී ආන්ඩුව ජයලලිතා විසින් තමිල්නාඩුවේ දී ගත් මූලිකත්වය අනුයන්නට සූදානම් බව අඟවා ඇත. වර්ජන තහනම් කිරීමේ පනතක් සූදානම් කරන්නේදැයි ස්වදේශ නියෝජ්‍ය ඇමති හරින් පතාක්ගෙන් අගෝස්තු 19 දා පාර්ලිමේන්තුවේ දී ප්‍රශ්න කෙරුනු විට ඔහු ප්‍රකාශ කලේ රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා දැනට පවතින "කල්ක්‍රියාවේ නීති" ඒ කටයුත්ත සඳහා යොදා ගන්නා බව ය.

## වෘත්තීය සමිතිවල බෙලහීනභාවය

කම්කරු පන්තියට එරෙහි මෙම ප්‍රහාරයන්ට මුහුන දීමේ දී, ඕනෑම බලයක් ඉදිරියේ තමන්ගේ පූර්න බෙලහීනභාවය වෘත්තීය සමිති පෙන්වා ඇත. සමස්ත ඉන්දිය ප්‍රාන්ත ආන්ඩු සේවක සම්මේලනයේ (ඒඅයිඑස්ජීඊඑෆ්) ලේකම් සුකොමාල් සෙන්, මහ ඇමතිනියගේ ක්‍රියාවන් ගැන සිය "බලවත් කනස්සල්ල හා උද්වේගය" ප්‍රකාශයට පත් කරමින් ශ්‍රේෂ්ඨාධිකරන තීන්දුව "ඉතා අවාසනාවන්ත" යැයි විස්තර කලේ ය. නමුත්, සීපීඅයි-එම් විසින් පාලනය කරනු ලබන ඒඅයිඑස්ජීඊඑෆ්ට මෙම තත්වයන්ට එරෙහිව කම්කරුවන් බලමුලු ගැන්වීමේ කිසිදු සැලැස්මක් නැත.

ඉන්දියානු වෘත්තීය සමිති කේන්ද්‍රයේ (සීඅයිටීයූ) නායක එම්.කේ. පාන්ඩේ ඉන්දියානු ෆ්‍රන්ට්ලයින් සඟරාව සමග පැවැත්වූ සාකච්ඡාවක දී අඟවා සිටියේ කිසිවක් එතරම් වෙනස් වී නැති බවත් ජයලලිතා ආන්ඩුවේ ක්‍රියාමාර්ග හුදකලා අහම්බයක් බවත් ය. "ඇඟවීම වන්නේ, නඩු තීන්දුව නොතකා හැරීමෙන් අත් වන ප්‍රතිඵලය කුමක් වුවත්, වර්ජනයන් සිදුවනු ඇති බව ය."

ජූලි 25 දා, නවදිල්ලියේ දී, ප්‍රධාන වෘත්තීය සමිති නිලධාරීහු, ආන්ඩුවේ ඇමතිවරුන් හා නිලධාරීන් සමග ස්ථාවර කම්කරු කමිටුව (එස්එල්සී) නමින් හැඳින්වෙන ත්‍රෛපාක්ෂික සභාවේ වාඩිගත්හ. රාජ්‍ය අංශයේ සේවකයන් දොට්ට දැමීම හෙලා දකින බෙලහීන යෝජනාවක් කමිටුවට ඉදිරිපත් කිරීමට ඔවුන් උත්සාහ කරද්දී කම්කරු ඇමතිවරයාගෙන් ඉදිරිපත් වූ විරෝධතාවය හමුවේ වෘත්තීය සමිති නිලධාරීහු "එස්එල්සී න්‍යාය පත්‍රය මුලුමනින් ම අවුල් කිරීමෙන් වලක්වාලීම සඳහා" එය කමිටුව ඉදිරියේ කියවීමෙන් පමනක් සෑහීමට පත් වූහ.

සීපීඅයි-එම් සහ ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය (සීපීඅයි) ඇතුලු කිසිදු විරුද්ධ පක්ෂයක්, දොට්ට දැමීම්වලට එරෙහිව හුදු නිල හෙලාදැකීමක් නිකුත් කිරීම හැරෙන්නට වෙනත් කිසිවක් කර නැත. වාම නැඹුරුවක් සහිත ෆ්‍රන්ලයින් සඟරාවට පවා මෙසේ සඳහන් කරන්නට සිදු විය: "සියලු වර්ගවල නායකයන්ගේ පුවත්පත් නිවේදන නිකුත් වී තිබුනේ වී නමුත් එක්සත් ක්‍රියා මාර්ගයක් සඳහා කිසිදු උත්සාහයක් නො තිබුනි. සර්ව පාක්ෂික රැස්වීමක් කැඳවා ගැනීම කල හැකි වූයේ අත්අඩංගුවට ගැනීම් හා දොට්ට දැමීම් සිදු වී සති දෙකක් ගත වීමෙන් අනතුරුව වීම වාම පක්ෂවල පවා කනගාටුවට හේතු විය."

පසුගිය දශකය තිස්සේ, කම්කරු පන්තියේ සමාජ තත්වයන්ට එරෙහි ප්‍රහාරයේ සෘජු හෝ වක්‍ර හවුල්කරුවන් වී සිටින මේ සියලු පක්ෂ හා සංවිධානවල අන්තයටම කුනු වූ ස්වභාවය, තමිල්නාඩුවේ කම්කරුවන් මහා පරිමානයෙන් දොට්ට දැමීමේ දී හෙලිදරව් වී තිබේ. සීපීඅයි-එම් සම්බන්ධයෙන් ගත් කල, එය, බටහිර බෙංගාලය හා කේරලය පාලනය කරන "වාම" සංධානවල ප්‍රධාන පක්ෂය ලෙස ආර්ථික ප්‍රතිසංස්කරනවල මූලිකත්වය ගත්තේ ය.

තමිල්නාඩුවේ කටුක අත්දැකීමෙහි තියුනු පාඩම් ඉන්දියානු අර්ධද්වීපය පුරා කම්කරුවන් විසින් උකහා ගත යුතුය. වර්ජනය කිරීමේ අයිතිය හා ජීවන තත්වයන් රැකගැනීම ඇතුලු, මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් රැකීමේ අරගලයක ආරම්භක ලක්ෂ්‍යය විය යුත්තේ, තමන් පවතින ධනවාදී ක්‍රමයේ උපාංගයන් බවට තහවුරු කර ගෙන ඇති, සීපීඅයි හා සීපීඅයි-එම් ඇතුලු සියලු සංවිධාන හා පක්ෂවලින්, පූර්න දේශපාලන බිඳීමකි. ආන්ඩුවේ හා සංගතයන්ගේ න්‍යාය පත්‍රයට අභියෝග කිරීම සඳහා, අතිවිශාල බහුතරයකගේ වියදමින්, වරප්‍රසාදිත සුලුතරයකගේ ලාභ ලැබීමේ "අයිතිය" ප්‍රතික්ෂේප කරන, සමාජවාදී ජාත්‍යන්තරවාදී මූලධර්ම මත පදනම් වූ, නව පිලිවෙතක් අවශ්‍ය වේ.

© www.wsws.org